"ක... කොෂි..." ඒ අශේන්ගේ හඬ ය.

මා හෙට ලංකාවට යන බව ඔහුට කිව යුතුද? තීරණයක් ගත නොහැකිව මම කල්පනා කළෙමි. අනතුරුව ඇඳෙන් බැසවිත් දොර ඇරියෙමි.

මගේ කාමරයේ උළුවස්සට අත්දෙක තබාගත් අශේන් පිස්සකු සේ කාමරය තුළට එබී බැළුවේ ය. ඔහුගේ රතුව ගිය ඇස් දෙක මා දවා අලු කර දමන්නට තරම් ගිනියම්ව තිබුණි. ඔහු දැඩි ලෙස බීමත්ව සිටින්නේ යයි මට සිතුණි.
"කාලකන්නියා.." මම කෑගැසුවෙමි. ".. උඹ ආයෙත් ජරා වැඩ පටන් ගත්තා නේද.?"

ඔහු වියරුවෙන් මෙන් සිනාසුණේය. ඒ සිනාවට තවත් කීප දෙනෙකුද හවුල් වනු මට ඇසුණි. ඔවුහු නිවස දෙදරා යන හඬකින් සිනාසුණ හ. මම දොර වසා ගන්නට උත්සාහ කළෙමි. අශේන් එය වළකමින් කාමරයට ඇතුල් වූයේ ය. ඊළඟ නිමේෂයේ දී ඔහුගේ දැඩි ග්‍රහණයට මම අසුවුණෙමි. මගේ කෑගැසීමේ හඬ අභිබවා සාලයේ සිටියවුන් සිනාසුණ හ.

අශේන් මෘගයෙකුව සිටියේ ය. නැතහොත් මත් ද්‍රව්‍ය විසින් ඔහුගේ සිහිය විකල් කොට දමනු ලැබ තිබුණේ ය. මගේ ශක්තිය පැරදවීම ඔහුට ඉතා පහසු දෙයක් විය. මම අප්‍රාණිකව වැතිර සිටියෙමි. මට වෙන කළ හැකි දෙයක් නොවී ය. සියල්ල අවසන ඔහු නැගී සිටියේ ය.

නෑ.... නෑ... ගිටපිය.. ඔහු කෑගැසුවේ ය. මගෙන් ප්‍රතිචාරයක් නොලද තැන ඉදිරියට පැන මගේ කොන්ඩයෙන් ඇද මා නැගිට්ටෙව්වේ ය. ඔහු ඒ ග්‍රහණයෙන්ම මා සාලයට.. සාලයේ සිටි සිවළුන් අතරට තල්ලු කර දැමුවේ ය. සාගතයෙන් සිටි කළෙක ලද හා මසක් ඩැහැ ගන්නට පනිනා ලෙස ඔවුහු එක වර මා වට කර ගත්හ.

අශේන් මහ හඬින් සිනාසෙනු සිහිසුන් වන්නට පෙර මට අවසන් වරට ඇසුණි.

මම මාස දහ නවයක් තිස්සේ මගේ කතාව ඔබට කියමින් සිටියෙමි. මම කිසිවක් නොසඟවා ඔබට සියල්ල හෙළිදරව් කළෙමි. එනමුදු මෙතැනින් ඔබ්බට ඔබට මගේ කතාව කියන්නට මට ආත්ම ශක්තියක් නැත. කෞෂල්‍යා ධර්මවර්ධන වන මගේ ආත්මය මෘගයන් විසින් විනාශ කර දමනු ලැබූ බව පමණක් මම ඔබට කියන්නෙමි.

මෙල්බන් ගුවන් තොට කරා ඇදෙන කුලී රිය බොහෝ හෙමින් ගමන් කරන්නේ යයි මට සිතෙයි. දැන් මට අවශ්‍යව ඇත්තේ හැකි තාක් ඉක්මනින් මේ වියරු ලෝකයෙන් ඉවත්ව යාමට ය.

වරෙක මම මේ පරිසරයට බොහෝ ඇලුම් කළෙමි. මා ආදරය කළවුන් මා අතැර ගියා සේ ම මම ද අද මේ පරිසරයෙන් වෙන් ව යන්නෙමි. මුලු ලෝකයම මා අතැර ගිය ද මට ආදරය කරන මට කරුණාව දක්වන එකම එක මිනිසකු සිටින බව මම දනිමි. ඒ මගේ තාත්තා ය. මම මට හැකි ඉක්මනින් ඔහු වෙත යන්නෙමි. ඔහු සුවපත් කරගන්නට මට හැකි සැම දෙයක්ම කරන්නෙමි. මම ඔහුගේ සෙවණැල්ල වෙමි. කිසිදා නොසැළුණ තාත්තාගේ ආදරය වෙනුවෙන් මට කළ හැකි අල්ප වූ යුතුකමක් වෙද මම එය ඉටු කරන්නෙමි.

"තාත්තේ.. තාත්තගෙ පුතා ආවා.." යි කියන තෙක් මට ඉවසිල්ලක් නැත.

තාත්තා මගේ නළල සිඹ "..මගේ රත්තරන් පුතා..." යි කියන බව මම සක් සුදක් සේ දනිමි.

**ගිම්හාන සුළඟ මෙතෙකින් අවසන් ය**






## Shyamon Jayasinghe

# REFLECTION ON OUR POST- INDEPENDENCE JOURNEY

**The** month of February is highlighted by our annual commemoration of independence from British rule, which by extension meant the end of European rule. All countries in this way left to manage their own affairs by Europeans who once occupied them, were at the time of the colonial departure mere geographic entities; not nations in the modern sense of that identity. This had been true of the then 'Ceylon'. Ceylon was not a national entity. It was left to its indigenous leaders to make Ceylon a nation or a unity of peoples of different groups. At the time of the arrival of the first European colonial power, the Portuguese, this geographic entity was comprised of several independently run political entities: the Kotte Kingdom that had shrivelled badly after Parakramabahu V1, Udarata that later developed into the Kandyan Kingdom, the Northern Kingdom of Jaffna that successfully reasserted itself after Parakramabahu V1, and the Vanni run by chieftains who had only nominal allegiance to the Jaffna King.



The unification process of the island began with the Portuguese when they tightened control over Kotte and when they annexed Jaffnapatam in the year 1619. Since then Jaffnapatam was never able to reassert itself as an independent political entity. The Dutch and the British continued the policy of treating Jaffnapatam as a mere unit of a larger political entity. This is one of the more durable and positive contributions made by Portuguese rule in Lanka.
The British had completed the political unification process when they annexed the Kandyan Kingdom in the year 1816. However, the British created another problem in its place by bringing in large numbers of Indian migrant labour to work in plantations during the decade commencing from the year 1830. This introduced a split in the demographic body politic and added to the pluralism already created by the Portuguese rule when the latter had introduced the Catholic religion to an island where Buddhism and Hinduism held sway along with a lesser group of Muslims who had migrated to the island in the 14th century for trading purposes. The Dutch brought in the Protestant religion whereas the British themselves brought in Anglicanism.

At the time European rule ended in February 1948, the island was a discernible plural state with a dominant majority Sinhalese-Buddhist population of about seventy per cent and a significant Tamil minority and a less significant minority group of Muslims

It is timely to reflect what out leaders have done since Independence toward the goal of unifying this complex polity. The process of natural social integration has since diminished the gap between the Kandyans and Low Country people. Muslims had integrated fairly well with the majority community. Christians and Buddhists, too, integrated well despite internal tensions.

However, we failed to continue this process of national integration due to our signal failure to build a rapport with the Tamil people-our most prominent minority. Sri Lanka's huge problem today remains in this area. It is our great failure- area. Tamil people unlike other demographic groups in the island, have a close association with a particular geographic area namely the North and East. This has helped create a sense of pride and belonging in them in a way not true of other minorities; adding to the fact that they represent one of the oldest and richest civilisations of the world- the Dravidian civilisation. For the most part Southerners left the Tamil people to themselves and assumed they were not important or took them for granted or treated them as a fly in the ointment. How many of us have been to Jaffna? I haven't. On the other hand, Tamils, too, preferred to live inside walls.

The LTTE problem can be viewed at three levels of analysis. The first and most superficial level is the one that regards the problem as a mere terrorist problem. The second is to regard it as a demand for autonomy by the Tamil community. The third is to perceive it as a failure in rapport- building between the Sinhalese people and the Tamils. There is, of course, the fact that the Tamil elite exploited and manipulated inter-communal differences to their own advantage. Global leaders have eschewed treating the LTTE problem in a simplified way as a mere terrorist phenomenon. It is because the latter empathise with the other two interpretations that they demand a negotiated political solution. The wide belief among these external powers is that LTTE terrorism is an extension of Tamil politics demanding refusal to be subsumed under a Sinhala majoritarian government at the centre. From here on Sri Lanka is at the crossroads. The future direction of the country would depend on the sagacity and tolerance of its leaders and of the majority

Sinhalese people ■

**සන්නස දායකත්වය ඔබට පහසුවක්.. අපට සහයෝගයක්**

**සන්නස තැපෑලෙන් නිවසටම ගෙන්වා ගන්න**
වසරකට වැයවන්නේ ඩොලර් 30ක් පමණයි.
වෙනත් රටවල් සඳහා වසරකට ඔස්ට්‍රේලියන් ඩොලර් 50 කි.
Sannasa News Group නමට ලියන ලද මුදල් ඇනවුමක් හෝ බැංකු අණකරයක් Sannasa PO Box 172 reservoir Vic 3073 Australia ලිපිනයට එවන්න

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

**දායකත්ව කූපනය**

නම ..................................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න) ..................................................

..................................................

සන්නස තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා වසරක දායක මුදල ලෙස SANNASA NEWS GROUP නමට ලියන ලද ඩොලර් 30 ක මුදල් ඇනවුමක්/චෙක් පතක් මේ සමග එවමි

අත්සන                    දිනය